# කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
## தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சு
## Ministry of Labour and Foreign Employment

හයවන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 05, ශ්‍රී ලංකාව.
6 ஆவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 05, இலங்கை.
6th Floor, " Mehewara Piyesa", Narahenpita, Colombo 05, Sri Lanka.


මගේ අංකය / எனது இல / My No. MFE/DEV/HOB/03/vol ii

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 2023.05.17

**කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 02/2022 (iv)**

**එතෙර රැකියා වල නියුතු ශ්‍රී ලාංකිකයන් හට පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීමට බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමය**

උක්ත යෝජනා ක්‍රමය යටතේ පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීමට බලපත්‍රයක් ලබා දීමට අදාලව එතෙර රැකියා වල නියුතු ශ්‍රී ලාංකිකයින් මෙරටට එවන ලද ප්‍රේෂණ සලකා බැලීමේ කාලසීමාව 2023.09.15 දින දක්වා දීර්ඝ කිරීමට 2023.05.15 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබේ.

ඒ අනුව 2022.08.31 දිනැති කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ චක්‍රලේඛ 02/2022 (සංශෝධිත) හි, 4.4 උප වගන්තිය පහත සදහන් පරිදි සංශෝධනය කෙරේ.

4.4 වාහන බලපත්‍ර ලබාදීමට අදාල සීමාවන් පහත දැක්වේ.

| ප්‍රේෂණ වල වටිනාකම (ඇ.ඩො.) | වාහන වර්ගය | හිමිකම ලැබීමට අදාලව ප්‍රේෂණ සලකා බලන කාලසීමාව හා වාහනයේ CIF වටිනාකම |
|---|---|---|
| 20,000 හෝ ඊට වැඩි | විදුලිබලයෙන් ක්‍රියාත්මක වන, රෝද හතරක් සහිත පහත සදහන් HS කේත යටතට ගැනෙන වාහන 8702.40.19, 8702.40.39, 8702.40.59, 8703.80.31 ,8703.80.32, 8703.80.33, 8703.80.34, 8704.90.31, 8704.90.32, 8704.90.33, 8704.90.34 | 2022 මැයි 01 දින සිට 2023 සැප්තැම්බර් 15 දින හෝ ඊට පළමුව වාහන බලපත්‍රය සඳහා ඉල්ලුම් කරන දින දක්වා ප්‍රේෂණය කරන ලද විදේශ විනිමය ප්‍රමාණයෙන් 50% ට අඩු හෝ සමාන CIF වටිනාකමකින් යුත් වාහන |

ඉහත චක්‍රලේඛයේ සදහන් අනෙකුත් සියළු විධිවිධාන නොවෙනස්ව පවතී.

ආර්.පී.ඒ. විමලවීර
ලේකම්
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය


ලේකම්/செயலாளர்/Secretary : +94 112 368164 කාර්යාලය/அலுவலகம்/Office : +94 112 581991 ෆැක්ස්/தொலைநகல்/Fax : +94 112 582938/+94 112 368165
විද්‍යුත් තැපෑල/மின்னஞ்சல்/E-mail : slmol@slt.lk / slmol@labourmin.gov.lk වෙබ් අඩවිය/இணையத் தளம்/Web site: www.labourmin.gov.lk